Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-: නර්තනය

සතිය- 1

7 ශ්‍රේණිය

Prepared by- එන් .කේ .පද්මා කාන්තිලතා

**නිපුණතා මට්ටම**;නිර්දේශිත ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු.

- පහත සඳහන් කියවීම් පත්‍රිකාව අධ්‍යනය කරන්න.

## මල් යහන් කවි

- අප රටේ අතීතයේ සිට පැවත එන ශාන්තිකර්ම පිළිබඳව ඔබ අසා ඇති.
- දෙවියන්, යකුන් හා ග්‍රහයින් උදෙසා ශාන්තිකර්ම පවත්වයි.
- දෙවියන්ගේ පිහිට අපේක්ෂා කර පවත්වන ශාන්තිකර්ම වල අරමුණු රාශියකි.

එනම්;

වසංගත රෝග වලින් ආරක්ෂා වීම.

භවභෝග සම්පත් වැඩිදියුණු කර ගැනීම.

අපල උපද්‍රව වලින් වැළකී සිටීම, ඉන් කිහිපයකි.

- මෙම ශාන්තිකර්ම වලදී දෙවියන්ට පුදසෙත් ලබාදී දෙවියන් සතුටු කර පිහිට ලබා ගැනීම සඳහා ශාන්තිකර්ම භූමියේ ඉදිකරන සැරසිල්ලක් වේ.එම සැරසිල්ල මල්යහන ලෙස හඳුන්වයි.
- ලී කෝටු,කෙසෙල් පතුරු,පට්ටා,ගොප් කොළ යොදා ගනිමින් මෙම මල් යහන නිර්මාණය කරයි.

- 

මල්යහන

- දෙවියන්ට මල් යහනට වඩින ලෙස ආරාධනා කරන කවි විශේෂය මල්යහන් කවි ලෙස හඳුන්වයි.
- උඩරට,පහතරට,සබරගමු යන නර්තන සම්ප්‍රධායයන් ත්‍රිත්වයේම මෙම ගායනා ඇතුලත් වේ.
- සාම්ප්‍රධායික ලක්ෂණ වලට අනුව ගායනා කරන නාද මාලාවේ වෙනස්කම් අසන්නට ලැබේ.
- ප්‍රාදේශිය විවිධත්වය අනුව පුද ලබන දෙවියන් මුල් කොට ගෙන මෙම ගායනා ඉදිරිපත් කෙරේ.

❖ මල්යහන් කවි වලට නිදසුන් පහත දැක්වේ.

මිහින්තලේ අටසැටලෙන සේල චෛත්‍යා වෙහෙරට

අඹතලාව මිරිසවැටිය භයාගිරිය නම් වෙහෙරට

ජයශ්‍රීමහ රුවන්වැලිය ථූපාරාමය වෙහෙරට

අටමස්ථානේ සිටියත් වඩින්න දෙවි මල් යහනට

පුටුව සරසලයි මම සැල කරන්නේ

පුටුවෙ තියෙන දළු බුලතුයි පුදන්නේ

කැටුව සිව්වරම් සමඟින් බලන්නේ

ශ්‍රියා දේවි මල් අස්නෙට වඩින්නේ

**පැවරුම්;**

I. මල් යහන් කවි ගායනා කරන අවස්ථා නම් කරන්න.
II. මල්යහන් කවි වල සුවිශේෂ ලක්ෂණ 3ක් ලියා දක්වන්න.
III. නියමිත නාදමාලාවට මල්යහන් කවි ගායනා කරන්න.